දුරකථන අංක/தொ. பே/Telephone:
කාර්යාලය / அலுவலகம் / Office: 025-2222532, Fax : 2225224
ප.අ.අ. / மா.க.ப / P.E.D: 025-2222430, Fax : 2222430
අ.ප.අ.අ. / மேல. மா.க.ப / Ad.P.E.D: 025-2222674, 025-2222532
ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant: 025-2222432, Fax : 2222432
නි.අ.අ. සැලසුම් / திட்டமிடல் / Plaining: 025-2220207, 025-2225222

මගේ අංකය / எனது இல / My No: උමැප/අදෙ/පා/04/01
ඔබේ අංකය / உமது இல / Your No:
අනුරාධපුරය / அநுராதபுரம் / Anuradhapura.
දිනය / திகதி / Date: 2023.10.26

# උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# வடமத்திய மாகாண கல்வித் திணைக்களம்
# NORTH CENTRAL PROVINCIAL EDUCATION DEPARTMENT

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**2023/2024 අන්තර් කලාප හා අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු අයදුම් පත් කැඳවීම**

2023/2024 වාර්ෂික ගුරු ස්ථාන මාරු සඳහා "ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය" යන මැයෙන් ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශ 2007/20 හා 2007.12.13 චක්‍ර ලේඛයේ විධි විධාන අනුව සුදුසුකම් සපුරා ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින ගුරු භවතුන්ගෙන් 2023.12.15 දිනට ප්‍රථම ඉල්ලුම්පත් කැඳවිය යුතුය. ඒ අනුව ඔබ කලාපයේ ස්ථාන මාරු සඳහා සුදුසුකම් සපුරා ඇති ගුරු භවතුන්ගේ 2023.11.30 දිනට ඉල්ලුම්පත් කැඳවා 2023.12.15 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුවට භාර දෙන ලෙස දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර නොගන්නා බවද කාරුණිකව දන්වා සිටිමි.

**පොදු උපදෙස්**

02. ස්ථාන මාරු අපේක්ෂා කරන ගුරු භවතුන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වන අතර ඉල්ලුම්පත් කැඳවීමේදී, එම කරුණු පිළිබඳව ඔබගේ විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

i. 2023.12.31 දිනට පළාතේ හෝ අදාල කලාපයේ වසර 05 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
ii. පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කර තිබීම.
iii. විගණන විමසුම් හා විනය පරීක්ෂණ නොමැති වීම.
iv. පෞද්ගලික ලිපිගොනුව නියමිත පරිදි යාවත්කාලීන වී තිබීම.

03. ගුරු සහයක පත්වීම් ලබා ඇති ගුරු භවතුන්ගේ පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කර ඇත්නම්, එම ගුරුභවතුන්ගෙන්ද අයදුම් පත් කැඳවිය හැකි අතර ඉහත අවශ්‍යතා සම්පූර්ණකර නොමැති ගුරු මහත්ම මහත්මීන්ගේ ස්ථානමාරු ඉල්ලුම්පත් මෙම දෙපාර්තමේන්තුව වෙත එවීමෙන් වැලකි ගුරු මාරු මණ්ඩලය වෙත සහය දක්වන ලෙස දන්වා සිටිමි.

04. ඔබ කලාප කාර්යාල මඟින් 2023.09.30 දිනට මෙම දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය වෙත ලබා දී ඇති ගුරු පුරප්පාඩු ලේඛන පාදක කොටගෙන 2023/2024 අන්තර් කලාප සහ කලාප තුළ වාර්ෂික ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති බැවින්, එම පුරප්පාඩු සඳහා පමණක් ගුරු භවතුන් වෙතින් ස්ථාන මාරු අයදුම්පත් පත් කැඳවිය යුතුය. එම පුරප්පාඩු ලේඛනය සහ අවශ්‍ය නම් අන්තර් කලාප, අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම් පත් education department ncp මගින් බාගත කොට ගන්නා ලෙස ගුරුභවතුන් දැනුවත් කළ යුතු අතර, එම පුරප්පාඩු ස්ථාන සඳහා ස්ථාන මාරු ඉල්ලුම් කරන ලෙස දැනුම් දිය යුතුය.

05. එසේම ඔබ වෙත ලැබෙන සියළුම අන්තර් කලාප හා අන්තර් පළාත් අයදුම්පත් මේ සමඟ අමුණා ඇති Microsoft Excel ආකෘතිය භාවිත කර 2023.12.15 දිනට පෙර ncpedes@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙසත් එහි දෘඩ පිටපතක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව මා වෙත ඉදිරිපත් කරන ලෙසත් දන්වා සිටිමි. අදාළ Microsoft Excel ආකෘතිය ඔබගේ විද්‍යුත් ලිපිනයට යොමු කර ඇත. එය බාගත කරගන්න.

06. ස්ථාන මාරු වී යන ගුරුභවතුන්ගෙන් නිර්මාණය වන පුරප්පාඩු පිරවීම, කලාප තුළ සිදු කරන ස්ථාන මාරුවලදී සිදු කළ යුතු අතර එහි වගකීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සතුවේ.

07. තවද, ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශ 2007/20 හා 2007.12.13 චක්‍රලේඛය අනුව කලාපය තුළ ස්ථාන මාරු සඳහා කලාප මාරු මණ්ඩල පිහිටුවා එම චක්‍රලේඛයේ කාල රාමුව අනුව කටයුතු කිරීම සඳහා මාරු මණ්ඩල සාමාජික ලේඛනය හැකි ඉක්මනින් ලැබීමට සලස්වන ලෙසත් එතෙක් කලාපය තුළ ස්ථාන මාරු සඳහා නියමිත මාරු ඉල්ලුම්පත් මගින් ඉල්ලුම්පත් කැඳවා චක්‍රලේඛයට අනුව ඉදිරි කටයුතු කරන ලෙසත් දන්වා සිටින අතර, අන්තර් කලාප ස්ථාන මාරු සිදුකොට ස්ථාන මාරු ලේඛනය ඔබ වෙත යොමු කිරීමෙන් අනතුරුව කලාප තුළ ස්ථාන මාරු සිදු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම් කටයුතු සිදුකරන බැවින් අතිරික්ත ගුරු ස්ථාන මාරු කිරීම් හැර, අනෙකුත් සියලුම ගුරු ස්ථාන මාරු කිරීම් අත්හිටුවීමට කටයුතු කරන ලෙසත් විශේෂ හේතූන් මත සිදුකළ යුතු ස්ථාන මාරුවක් නම් පමණක් මාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත් දන්වා සිටිමි.

09. 2022/2023 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කොට මේ වන තෙක් ස්ථාන මාරු නොලද ගුරුභවතුන් හට මෙවර වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් නොකරන ලෙස ද ඉදිරි බඳවා ගැනීම් මගින් ස්ථාන මාරු ලබා දෙන බවට ද ගුරු භවතුන් දැනුවත් කළ යුතු බවට වැඩිදුරටත් දන්වා සිටිමි.

**අන්තර් කලාප**

10. ඊට අමතරව අන්තර් කලාප ස්ථාන මාරු ඉල්ලුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි අමුණා එවිය යුතු වන අතර අඩුපාඩු සහිත කිසිඳු අයදුම්පතක් භාර නොගන්නා බවද දන්වා සිටිමි.

- සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද පත්වීම් ලිපියේ පිටපත
- සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද සේවය ස්ථිර කිරීමේ ලිපිය
- විනය පරීක්ෂණ හා විගණන විමසුම් නොමැති බවට ලිපිය

(මීට අමතරව ලකුණු ලබා ගැනීම සඳහා විවාහ සහතිකය සහ දරුවන්ගේ උප්පැන්න සහතික ඉදිරිපත් කරන ලෙස විදුහල්පතිවරුන් මගින් ගුරු භවතුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.)

**අන්තර් පළාත්**

11. අන්තර් පළාත් ස්ථාන මාරු ඉල්ලුම්පත් සමඟ පිරික්සුම් ලැයිස්තුවෙහි (ඇමුණුම 05 හි) සඳහන් ලියකියවිලි අමුණා එවිය යුතු වන අතර අඩුපාඩු සහිත කිසිඳු අයදුම්පතක් භාර නොගන්නා බවද දන්වා සිටිමි.

12. මධ්‍යම පළාත් සභාවේ, ඇමුණුම 06 හි සඳහන් කලාපයන් වෙත පමණක් ස්ථාන මාරු අයදුම් කළ හැක.

13. බස්නාහිර පළාත් සභාවේ ඇමුණුම 07 හි සඳහන් විෂයන් සඳහා පුරප්පාඩු පවතින බැවින් එම විෂයන් සඳහා ස්ථාන මාරු අයදුම් කළ හැක.

ok

එස්.එම්.ඩබ්.සමරකෝන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

එස්.එම්.ඩබ්. සමරකෝන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

පිටපත් -:
01. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,උ.මැ.ප - කා.දැ.පි
02. ආණ්ඩුකාරවර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,උ.මැ,ප. - කා.දැ.පි.
03. ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,උ.මැ.ප. - කා.දැ.පි.

දුරකථන අංක/தொ. பே/Telephone:
කාර්යාලය / அலுவலகம் / Office 025-2222532 Fax : 2225224
ප.අ.අ. / மா.க.ப / P.E.D 025-2222430 Fax : 2222430
අ.ප.අ.අ. / மே.மா.க.ப / Ad.P.E.D 025-2222674 025-2222532
ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant 025-2222432 Fax : 2222432
සී.අ.අ. සැලසුම් / திட்டமிடல் / Plaining 025-2220207 025-2225222

මගේ අංකය / எனது இல / My No } උමැප/අදෙ/පා/04/05

ඔබේ අංකය / உமது இல / Your No }

අනුරාධපුරය / அநுராதபுரம் / Anuradhapura.

දිනය / திகதி / Date } 2023.11.03

# උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# வடமத்திய மாகாண கல்வித் திணைக்களம்
# NORTH CENTRAL PROVINCIAL EDUCATION DEPARTMENT

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**2023/2024 අන්තර් කලාප හා අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු අයදුම් පත් කැදවීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා2023.10.26 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව, 2023/2024 අන්තර් කලාප ස්ථාන මාරු අයදුම් පත් කැදවීම සඳහා ඔබ වෙත යොමු කර ඇති පොදු උපදෙස් මාලාවේ 04. වන වගන්තිය අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

o/c

**එස්.එම්.ඩබ්.සමරකෝන්,**
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

එස්.එම්.ඩබ්. සමරකෝන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

පිටපත් -:
01. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,උ.මැ.ප - කා.දැ.පි
02. ආණ්ඩුකාරවර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,උ.මැ,ප. - කා.දැ.පි.
03. ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,උ.මැ.ප. - කා.දැ.පි.